පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 492
ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන්, ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492
நிறுவனத்தின் பெயர் :- மாவட்டச் செயலகம், முல்லைத்தீவு
பாராளுமன்ற அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No :- 492**
**Name of the Institution :- District Secretariat, Mullaitivu**
**Submission of observation Of Hon. Minister and steps taken with regard to the report table by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)**

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරස්‍රය - කොළඹ 07.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- **492**

ආයතනයේ නම :- **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්**

කොටස - **I**

| අ.අංක | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | දෝෂ නිවැරදි කිරීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01. | අනතුරු සම්බන්ධ වාර්තා කාලානුක්‍රමිකව පවත්වාගෙන නොමත. | අනතුරු සම්බන්ධ වාර්තා වර්තමානයේ පවත්වාගෙන යනු ලැබේ. 2024 වර්ෂය සඳහා වූ කාර්ය සාධන ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. |
| 02. | 2004.05.11 දිනැති 171/2004 අංක රජයේ ගිණුම් චක්‍රලේඛය අනුව මෘදුකාංග සම්බන්ධ පළමු දෙවන සහ තෙවන මුරපද මාස තුනකට වරක් වෙනස් නොකෙරේ. | 2004.05.11 දිනැති 171/2004 චක්‍රලේඛයට අනුව මෘදුකාංග සම්බන්ධ පළමු දෙවන සහ තෙවන මුරපද මාස තුනකට වරක් වෙනස් කරනු ලැබේ. ඒ සඳහා ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. |
| 03. | ප්‍රධාන විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියලුම විගණන විමසීම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු යවා නොමැත. | වර්තමානයේ සියලුම විමසීම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු යවනු ලැබේ. |
| 04. | එක් වාහනයක් භාවිතයෙන් ඉවත් කර මාස 08කට අඩු කාලසීමාවක් තුළ බැහැර නොකර ඇත. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාවිත නොකරන වාහන නිසි ක්‍රමවේදය අනුව බැහැර කරනු ලැබේ. |

කොටස - II

| අ.අංක | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | දෝෂ නිවැරදි කිරීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාසිකව නොපැවැත්වේ. | වත්මන් චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වර්තමානයේ කාර්තුවකට වරක් පවත්වනු ලැබේ. |
| 02. | දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් මාසිකව නොපැවැත්වේ. | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම සෑම මසකම සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම මාරුවෙන් මාරුවට පැවැත්වේ. |
| 03. | දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව කැඳවා නොමැත. | දිස්ත්‍රික් නිවාස කමිටු රැස්වීම සෑම මසකම ක්‍රමානුකූලව පැවැත්වේ. |
| 04. | දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව කැඳවා නොමැත. | අවශ්‍යතා ඇති වන විට දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වනු ලැබේ. |
| 05. | ආයතනයේ පුරවැසියන්/සේවා ලාභීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට සහ ඇගයීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | වර්තමානයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. එය ඇගයීමට ක්‍රමවේදයක් ද සකස් කරනු ලැබේ. |
| 06. | රාජ්‍ය පරිපාලන ආයතන සඳහා ගැළපෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | වර්තමාන චක්‍රලේඛවලට අනුව සකස් කරනු ලැබේ. |
| 07. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සුදුසුකම් සහිත / එකඟතාව ප්‍රකාශ කිරීමට නොහැකි / අහිතකර මට්ටමේ පැවතුනි. | සුදුසුකම් සහිත මතය ප්‍රකාශ කිරීමට අහිතකර මට්ටමේ පැවති හේතු හඳුනාගෙන ඒවා නිවැරදි කර ඇත. |
| 08. | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත. | වර්තමානයේ ආපදා කළමනාකරණ කමිටු රැස්වීම කාර්තුවකට වරක් පවත්වනු ලැබේ. |

අ.උමාමහේෂ්වරන්
දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

A.Umamaheswaran
District Secretary/Government Agent
Mullaitivu

එස්.රන්ජිත්කුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

S. RANJITHKUMAR
Chief Accountant
For District Secretary
District Secretariat
Mullaitivu